
කවරයේ කතාව

# මංගල ඡායාරූපකරණය



**ඉන්ද්‍රනාථ තේනුවර**

ප්‍රවීන මංගල උත්සව ඡායාරූප ශිල්පියෙකි. හේ රාජ්‍ය සම්මාන දිනූ පොත් කවර සැලසුම් ශිල්පියෙක් වන අතර, ප්‍රථම මංගල උත්සව ඡායාරූප ප්‍රදර්ශනය පැවැත් වූ ශිල්පියා ද වෙයි. එසේම ඡායාරූප ශිල්පය පිළිබඳ ගුරුවරයෙක් , ලේඛකයෙක් හා ප්‍රවීන දේශකයෙකි.



*සුවිශේෂී සිදුවීම් අවස්ථා වාර්තා ගතව තැබිය හැකි කදිම මාධ්‍යය ඡායාරූපයයි. මෙ නිසා ම ඡායාරූප ශිල්පයට කාලානුරූපීව වැඩි වටිනාකමක් හිමි වී ඇති අතර, එය සමාජයේ අත්‍යවශ්‍ය අංගයක් වී ඇති බව ද පෙනේ.*

එහි ලා ඡායාරූප ශිල්පියකු සඳහා වැඩිම ඉල්ලුමක් පවතින්නේ සරණ මංගල්‍ය වාර්තාකරණයට යි. මෙහි ආරම්භය ඡායාරූප ශිල්පයේ බිහිවීමට සමගාමීව සිදු නොවූවකි.

ලාංකේය ඉතිහාසයේ පළමුවරට විවාහයක් ලියාපදිංචි කිරීම සිදුවූයේ 1906 ඉන්දේසි පාලන යුගයේදී ය. එතැන් පටන් නිවෙස්වලට පැමිණ විවාහ ලියාපදිංචි කිරීම සිදුවූයේ කාලයාගේ ඇවෑමෙනි එකල මෙවැනි විවාහයක් ඡායාරූප ගත කිරීම පහළ මැද පාංතික සාමාන්‍ය ජනයාට කළ නොහැක්කක් විය.ඡායාරූපගාර, කැමරා වැනි සම්පත් ඉහළ ධනපති පැළැන්තිය සතු වීම ඊට එක් හේතුවකි. එසේම මෙය සිය සමාජ තත්ත්වය ලොවට හෙළි කරන ආභරණයක් ලෙස ද ඔවුහු භාවිත කළහ. මනාල යුවල එක්ව නැදෑ හිතවතුන් ගේ එක සමූහ ඡායාරූපයක් පමණක් ගනු ලැබීම මෙහි ලා විශේෂත්වයකි. සියලු දෙනාට ම පිංතූරයට පෙනී සිටීමට ඉඩ කඩ මදි අවස්ථාවල දී ගස් කපා දමන්නට ද සිදු වූ අවස්ථා විය. මංගල ඡායාරූපකරණ ඉතිහාසයේ පළමුවරට ආරම්භයේ සිට අවසානය දක්වා සිය විවාහ මංගල උත්සවය ඡායාරූප ගත කළේ වර්ෂ 1912 දී ය. ඒ කළුතර දිසානායක පඬිකාර මුදලි ආතර් විජේසිංහ ය. අදටත් එකී පිංතූර රිච්මන්ඩ් කාසල් බංගලාව පුරා එල්ලා ඇති අයුරු දැකිය හැකිය. මුල් අවධියේ ඉහළ ධනපති පැළැන්තිය පමණක් මෙම ඡායාරූප ශිල්පය ඇසුරු කළ නිසා එම නිවෙස්වල සිදුවීම් වාර්තාකරණයට පැමිණෙන ඡායාරූප ශිල්පීහු ද එකී පැළැන්තියේ අය වූහ.

එම යුගයට ආයුබෝවන් කියමින් 1965 න් පසු මෙය සමාජ ගතවන්නට විය. ඊට තුඩු දුන් කරුණ වූයේ සාමාන්‍ය සුළු ව්‍යාපාරික පිරිස් ක්‍රමිකව මුදලාලි පැළැන්තිය ආක්‍රමණය කිරීම හා ව්‍යාපාරික ආභාෂය ලැබීම ය. ඡායාරූප ශිල්පය මෙසේ සමාජගත වීමේ දී ප්‍රධාන ස්ථානය හිමි වූයේ සරණ මංගල්‍යයට ය. 1977 න් පසු ඇති වූ ප්‍රවණතාවේ ප්‍රතිඵලයක් ලෙස කැමරා, පටල පට ඡායාරූප මුද්‍රණ කඩදාසි, වර්ණ ඡායාරූප තාක්ෂණයේ ආගමනය සිදු විය. ඒ සමඟ මෙම ශිල්පය සමාජ ගත වීම වඩාත් තහවුරු විය.

මංගල ඡායාරූප ගත කිරීමේ දී පසුකාලීනව අවම වශයෙන් පිංතූර 200 ක් හෝ 300 ක් ගනු ලැබිණ. මෙම ක්‍රමවේදයේ සුවිශේෂී වෙනසක් ඇති වූයේ 1990 දී ය. ඒ මහින්ද ප්‍රනාන්දු නම් ඡායාරූප ශිල්පියා විසින් අත්‍යවශ්‍ය සිදුවීම් පමණක් යොදමින් පළමුවරට 18 – 13 ඇල්බමය සැකසීමෙනි. මුල් අවදියේ දී කළු පැහැති තිරරෙද, ඡායාරූප ගැනීමේ දී භාවිත විය. එය දකුණු ඉන්දීය චිත්‍රපට හරහා මෙරට ඡායාරූපකරණයට ගලා ආවකි. මෙම කළු තිර භාවිතය නිසා ආලෝකකරණය ද අත්‍යවශ්‍ය අංගයක් බවට පත් විණි. මෙහි ලා පුරෝගාමී ශිල්පියෙක් ලෙස දයාන් විතාරණ හඳුනාගත හැකිය.

එකී ආභාෂයෙන් මිදී මේ වනවිට ස්වාභාවික ආලෝක තත්ත්ව යටතේ ස්වාභාවික පරිසර සාධක තුළ පිහිටා මංගල ඡායාරූප ගැනීමට ශිල්පීහු යුහුසුළු වෙමින් සිටිති. මෙය හඳුන්වනු ලබන්නේ "Simple and Classic" යනුවෙනි. එනම් "සරල හා සාම්ප්‍රදායික" යන අරුතයි.

ඡායාරූප තාක්ෂණය ඉතා වේගයෙන් සංවර්ධනය වූවකි. මුල් අවධියේ කළු සුදු ඡායාරූප පමණක් භාවිත වුවද ඉතාම කලාතුරකින් වර්ණ ඡායාරූප ද ගනු ලැබිණි. එකල වර්ණ ඡායාරූප කෙරෙහි පැවැති උනන්දුව එතරම් උදාසීන තත්ත්වයක පැවතියේ ඒවා එංගලන්තයට යවා මුද්‍රණය කිරීමට සිදුවීම නිසාය. ඒ සඳහා මාස 06 ක් පමණ ගත විය. මෙරට වර්ණ ඡායාරූප මුද්‍රණය ඇරඹියේ 1978 න් පසුය.

සරණ මංගල්‍යයක් ඡායාරූප ගත කිරීමේ දී ඡායාරූප ශිල්පියා විසින් මනාලිය නිරූපිකාවක නොවන බව තේරුම් ගත යුතුය. එහිදී වැදගත්ම සාධකය වන්නේ ඡායාරූප ශිල්පියා සතු සන්නිවේදන හැකියාවයි. එහි දී ඔහු සොඳුරු ආඥාදායකයකු විය යුතුය.

**නිලූකා ඩී.තිලකරත්න**